# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලද.

**නො. 8,439—1939ක්වූ මාර්තු මස 17 වෙනි දිනවූ සිකුරාද.**


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

1931සේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 1,957 (මාතලේ).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1939ක්වූ මාර්තු මස 17වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931සේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒවා කටයුතුකරණ බවද එකී ආඥාපනතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1939ක්වූ පෙබරවාරි මස 13වෙනි දින මාතලේ කච්චේරියේදීය.

ආර්. එච්. ඩී. මැන්ඩර්ස්,
ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මාතලේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකටවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම් වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ දකුණු කෝරළයේ අස්ගිරි උඩසියපත්තුවේ මාතලපිටිය යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—මුල් සිතියමේ නො. A 204.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම් තරම, අ. | රූ. | ප. |
|---|---|---|---|---|
| 1 | වල්ගල්කන්ද .. .. | 5 | 0 | 25 |
| 2 | එම .. .. | 3 | 0 | 10 |
| 3 | වල්ගල්කන්ද, ගල්ලිඳහේන .. | 0 | 3 | 16 |
| 4 | එම .. .. | 2 | 2 | 1 |
| 5 | වල්ගල්කන්දේහේන .. .. | 0 | 3 | 12 |
| 6 | වල්ගල්කන්දේමුදුනේහේන .. | 1 | 2 | 22 |
| 7 | වල්ගල්කන්දහේනේමුදුනේහේන .. | 1 | 2 | 33 |
| 8 | වල්ගල්කන්දහේන .. .. | 0 | 0 | 2 |
| 9 | තැන්නපිටහේන සහ දුම්මලගහමුලහේන .. | 0 | 3 | 1 |
| 10 | වල්ගල්කන්දේමුදුනේහේන නොහොත් කොබ්බෑයබැද්දහේන .. .. | 1 | 1 | 6 |
| 11 | පේරගොල්ලේහේන .. .. | 0 | 2 | 37 |
| 12 | එම .. .. | 0 | 0 | 31 |
| 13 | වල්ගල්කන්දදහසිනාගලමුලහේන, දකසියා කන්දේහේන, වල්ගල්කන්ද, කහගයාවූගේ හේන සහ රටකොටුරගොල්ලේහේන .. | 6 | 2 | 7 |
| 14 | පේරගොල්ලේහේන සහ බූවාගේමැටිවලහේන | 0 | 0 | 16 |
| 15 | බූවාගේහේන නොහොත් පේරගොල්ලේහේන | 1 | 2 | 11 |
| 16 | පේරගොල්ලේහේන සහ බූවාගේමැටිවලහේන | 0 | 1 | 33 |
| 17 | එම (පාරට වෙන්කල බිම්කට්ටිය) .. | 0 | 0 | 7 |
| 18 | පේරගොල්ලේහේන සහ බූවාගේමැටිවල හේන (අඹිපාරදිගේ වෙන්කල බිම) .. | 0 | 0 | 7 |
| 19 | එම ( එම ) .. | 0 | 0 | 15 |
| | | 27 | 2 | 12 |

මීට මායිම්—උතුරට නෑසිගිය සී. අරියනායගම් මහතාගේ බූදලේට හිමිකාරයින් සහ මාතලපිටියේ අංගෙගෙදර බාලයා විසින් T. P. 101,883 දරණ පිඹුරුකඩදාසියපිට අයිතිවාසිකම්කියන ඉඩම, නො. 8,677 දරණ මුල් සිතියමේ 16, 16A, 16B සහ 16Cවෙනි බිම්කට්ටි සහ මාතලපිටියේ උඩමුල්ලේගෙදර බෝදියා විසින් T. P. 418,548 දරණ පිඹුරුකඩදාසිය පිට අයිතිවාසිකම්කියන ඉඩමද; නැගෙනහිරට මාතලපිටියේ පල්ලේමුල්ලේගෙදර පුරයා සහ බී. එච්. ගුණසේකර විසින් T. P. 409,649 දරණ පිඹුරුකඩදාසිය පිට අයිතිවාසිකම්කියන ඉඩම, මාතලපිටියේ උඩමුල්ලේගෙදර අප්පුවා විසින් T. P. 418,605 දරණ පිඹුරුකඩදාසියපිට අයිතිවාසිකම්කියන ඉඩම, තිකනහාමින්නේගෙදර තින්දුවා සහ මුලගහමුලගෙදර කිරිසන්ද විසින් T. P. 418,604 දරණ පිඹුරුකඩදාසියපිට අයිතිවාසිකම්කියන ඉඩම, ඩබ්ලිව්. කුනාගි විසින් අයිතිවාසිකම්කියන ගල්ලෙනමුල්ලහේන, අඹගහමුලගෙදර බෝදියා විසින් T. P. 366,639 දරණ පිඹුරුකඩදාසිය පිට අයිතිවාසිකම් කියන ඉඩම සහ නො. 8,547 දරණ මුල් සිතියමේ 6වෙනි බිම්කට්ටියද; දකුණට මාතලපිටියේ පල්ලේමුල්ලේගෙදර

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Nuwara Eliya No. 93.**—මධ්‍යම දිසාවේ නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1939ක්වූ මැයි මස 15වෙනි දිනවූ සඳුදා උදේ 11ට හඟුරන්කෙත තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවී ඇත. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ උඩහේවාහැට කෝරළයේ පිහිටා තිබෙන හිමිකැබලි 9ක්.

මූල් සිතියමේ නො. A 540. ගම—උඩුතුලෙ.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1 | දරබදිනපිටිය | ගල්පොත්තේගෙදර විදුනෙ | ආණ්ඩුව සහ ඉල්ලුම්කාරයා | හේන (උඩුතුල්බයට ඉතුරුකර කොටස) | 0 0 33 | —* |
| 2 | එම | — | එම | හේන | 0 1 9 | 40† |
| 3 | එම | — | එම | හේන (ගම්සභාපාරට ඉතුරුකර කොටස) | 0 0 3 | —* |
| 4 | එම | — | ආණ්ඩුව සහ උඩුතුලේ පදිංචි දවුල්කාරගෙදර පුංචිබබා | එම ( එම ) | 0 0 4 | —* |
| 5 | එම | — | එම | හේන (කඳුගොල්ල කඩුරට ඉතුරුකර කොටස) | 0 0 5 | —* |
| 6 | එම | ගල්පොත්තෙගෙදර විදුනෙ | එම | හේන | 0 0 15 | 40† |
| 7 | එම | — | එම | හේන (උඩුතුල්බයට ඉතුරුකර කොටස) | 0 0 38 | —* |
| 8 | එම | — | ආණ්ඩුව සහ ගල්පොත්තේ ගෙදර විදුනෙ | එම ( එම ) | 0 1 3 | —* |
| | | | මූල් සිතියමේ නො. 9,167. ගම—දමුනුමැය. | | | |
| 9 | බෝලගෙදරකොටුව | — | ආණ්ඩුව සහ බෝලගෙදර හිංගිරිබන්ඩා | පතන | 4 3 3 | 16† |

* විකිණීමට නොවේ. † බේරීමට.

මෙම ඉඩම් ගැණ වැඩිදුර තොරතුරු නුවරඑළියේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1939ක්වූ මාර්තු මස 11වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3න් අණපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ සාධුප්‍රත්තකම, එනම්:—පරගොඩ ගොවිජනපදයට පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ අණපනතේ" හයවෙනි කාණ්ඩයේ කාරනාවෙහි පංචාර්ථවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරයා විසින් සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. A 947. ගම—පරගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හාරංනස්හේන | අවුරුදු 30ක් වයස පොල්ගස් 3ක් ඇති පොල් ඉඩම | ඇල්. ඇස්. පී. ඇස්. පී. සභාපති වේවිමියාර්, කොච්චිකඩේ | 0 0 10·3 |
| 2 | මිලුකඳන්වත්ත | අවුරුදු 5–35 වයස පොල්ගස් 2ක් සහ අවුරුදු 3ක් වයස පුවක්ගහක් ඇති පොල් ඉඩම | හෙසිහාහායකපතිරන්නැහෙලාගේ දයානන්ද, පරගොඩ | 0 0 7·7 |
| 3 | බෝගහහේන | අවුරුදු 15–40 වයස පොල්ගස් 9ක්ද, අවුරුදු 1–3 වයස පොල්පැල 7ක්ද, අවුරුදු 2–5 වයස රත්කපැල 14ක්ද, අවුරුදු 2–4 වයස හල්මිල්ලපැල 5ක්ද, අවුරුද්දක් වයස කජු ගහක්ද, අවුරුද්දක් පමණ වයස කෙසෙල් පඳුරු 2ක්ද, ඇති පොල් ඉඩම | අදිකාරිඅප්පුහාමිලාගේ ආගෝ නෝනා, පරගොඩ | 0 1 10·7 |
| 4 | හාරංගස්හේන | අවුරුදු 8–30 වයස පොල්ගස් 11ක්ද, මාස 6ක් වයස පොල්පැල 7ක්ද, අවුරුදු 5–30 වයස කජුගස් 4ක්ද, කොස්ගස් 2ක් සහ පුවක්ගස් 7ක්ද ඇති පොල් ඉඩම | ඇල්. ඇස්. පී. ඇස්. පී. සභාපති වේවිමියාර්, කොච්චිකඩේ | 0 1 8 |
| 5 | එම | අවුරුදු 8–20 වයස පොල්ගස් 3ක් සහ පුවක්ගස් 2ක්ද, අවුරුදු 12ක් වයස කොස්ගහක්ද ඇති පොල් ඉඩම | එම | 0 0 6·8 |
| 6 | එම | අවුරුදු 8ක් වයස පොල්ගහක් සහ කජුගහක්ද, කපරුරුකොකල ලිඳක්ද ඇති පොල් ඉඩම | හෙසිහාහායකපතිරන්නැහෙලාගේ දනියෙල් අප්පුහාමි, පරගොඩ | 0 0 10·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ නියමයාකාර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ පැමිණෙකකම් තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ අප්‍රේල් මස 19වෙනි දින අ. භා. 2ට හිරිගම තානායමේදී එදිරිපිටව පැමිණ ඒ ගොසි අදාලම අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ මාර්තු මස 14වෙනි දින කොළඹ කච්චේරියේදීය.

සී. ජී. විල්කි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුව.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තක්ම, එනම්:—කිරිල්ලවල පිරිමි පාඨශාලාව සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වෙනි ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාර මහතාණන් හාවට උතුම් ආණ්ඩුකාරතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 984. ගම—සූරියපාලුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | අඹගහවත්ත .. | අවුරුදු 50ක් වයස පොල්ගස් 2ක් සහ කොස්ගහක්ද, අවුරුදු 4–8 වයස කිතුල්ගස් 12ක්ද, අවුරුදු 6ක් වයස කජුගස් 4ක්ද, බෝරගහක් 2ක් සහ කොස් ගහක්ද ඇති පොල් ඉඩම | සී. ඇල්. පෙරේරා, "නවාතැන" කැළණිය | 0 2 15·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ අප්‍රේල් මස 21වෙනි දින පස්වරු 2ට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ මාර්තු මස 13වෙනි දින කොළඹ කච්චේරියේදීය.

සී. ජේ. පිල්නි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මහතා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තක්ම, එනම්:—නාගොඩ සිංහල මිශ්‍ර පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වෙනි ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 960. ගම—නාගොඩ, කළුතර තොටමුණේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දමටගහවත්ත .. | අවුරුදු 20ක රබර්ගස් 126ක්, අවුරුදු 30ක පොල්ගස් 5ක්, අවුරුදු 10ක පුවක්ගහක්, අවුරුදු 10ක දෙහිගහක්, අවුරුදු 10ක බෙලිගහක්, අවුරුදු 20ක මාරගහක් සහ අවුරුදු 15ක ජම්බුගහක් තිබෙන ඉඩමක් | ඩී. ජේ. ගුණවර්ධන, කලමුල්ල, කළුතර | 0 3 32·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ අප්‍රේල් මස 18වෙනි දින පස්වරු 2·30ට කාලයට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ මාර්තු මස 14වෙනි දින කළුතර කච්චේරියේදීය.

එම්. ජිනදාස,
කළුතර ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මහතා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තක්ම, එනම්:—ඌරුත්තුරේ වතුර සැපයීමේ ව්‍යාපාරය පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876වෙනි ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 1,293. ගම—නාරන්තනෙ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | බදිනින්ඩකුලම් .. | ලිඳක් සහිත පොල්අතු සෙවිලිකරනලද අනිස්සිර කඩ ගොඩනැගිල්ලක්ද, අවුරුදු 2–3 අතර වයසැති කෙසෙල්පඳුරුද ඇති දුන්කල වත්තක් | (1) කරම්පගේ ෆ්‍රාන්සිල් මනුවෙල් පුල්ලේ සින්නතුරේ, (2) කරම්පගේ සින්නතුරේ රාසු පුස්පම් | 1 0 10·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම දෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ අප්‍රේල් මස 22වෙනි දින උදේ 9ගේ කාලයට කයිට්ස් රෙස්ට්හවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. මේ ඉඩමේ ඔප්පුත් ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1939ක්වූ මාර්තු මස 9වෙනි දින යාපනේ කච්චේරියේදීය.

ආර්. සී. නෑෂ්,
උ. ප. ආණ්ඩුවේ ඒජන්ත මහතා.

---

## අන්‍ය දැන්වීම.

කළුතර දිස්ත්‍රික්කයේ හේවගම්කෝරළේ පස්දුන්කෝරළේ වෙල්ගම පදිංචි ඩෙන් කරෝලිස් ගම්මන්පිල වන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරන පිණිස මෙවක් පවත් තුන්මාසයක් ගතවූ පසු රෙජිස්ත්‍රාර් ජනරල් තුමාගෙන් ඉල්ලීමට අදහස්කර සිටින බව වර්ෂ 1907 අංක 1 දරණ ආඥාපනතේ 1B දරණ උප ලේඛනයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඩී. සී. ගම්මන්පිල.

වර්ෂ 1939ක්වූ පෙබරවාරි මස 28වෙනි දින වෙල්ගමදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.